# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,579 — 1958 නොවැම්බර් 7 වැනි සිකුරාදා — 7.11.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# III වැනි කොටස—ඉඩම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :— | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |

| | පිට |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | 1639 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... | 1644 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය : කාර්‍ය.ඒ.400.

**1954රේ අංක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කළ පරිදි**

**1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

**5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954රේ අංක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කළ පරිදි, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ එගොඩ උයනේ පිහිටි ලංසියාවත්ත යන ඉඩමෙන් රූඩ් 2 යි, පාර්චස් 8ක පමණ විශාලකම් ඇති කොටසක්. ඊට මායිම් :—

උතුරට : ඩී. ඇල්. අබේසේන මහත්මයා අයිතිකම් කියන ඉඩම ;

නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස (අඩි 12ක පළල ඇති ඉතිරි බිම් කොටස) ;

දකුණට : පානදුර ගඟ ;

බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස.

1958ක්වූ ඔක්තෝම්බර් මස 15 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ වාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි ;

මහනුවර දිස්ත්‍රික්කයේ බැද්දේගම වසමේ බැද්දේගම ගමෙහි පිහිටි මාරිලන්ඩ් වතුයායට අයත් මුදුනේකුඹුර නැමති ඉඩමෙන්, දිගින් අඩි 150ක්ද පලලින් අඩි 5ක්ද පමණවූ පහත මායිම් සඳහන් බිම් ප්‍රමාණය :—

උතුරට : ගම්සභා පාර ;
නැගෙනහිරට : මාරිලන්ඩ් වතුයාය ;
දකුණට : සුසාන භූමියක් සඳහා රජය අත්පත්කර ගැනීමට යන ඉඩම ;
බස්නාහිරට : මාරිලන්ඩ් වතුයාය.

අංක : ඇල්.ඩී. 4983 ජේ 57 ඇල්.ජී.37.

1958ක්වූ ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත්, එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ වාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ගංගොඩ ගම්මුලාදැනි වසමේ උඩපිටවල ගමෙහි පිහිටි ප්‍රමාණයෙන් අ. 4, රූ. 2, ප 0ක් පමණවූ එන්සල්වත්ත නමැති පහත සඳහන් මායිම් ඇති යාබද ඉඩම් කොටස් දෙක :—

උතුරට : කළුන්තැන්න සහ දිප්පිටිය නමැති ඉඩම් (රජයේ කැලේ) ;
නැගෙනහිරට : රජයේ කැලේ ;
දකුණට : හුන්නස්ගිරිය–වෙරගන්තොට ප්‍රසිද්ධ පාර ;
බස්නාහිරට : කේ/කළුන්තැන්න ජෝෂප් පාසැලේ ඉඩම (රජයේ).

අංක : ජේ. 57/58 ඊ 538/ඇල් සී/ඒ–-25.

1958ක්වූ ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත්, එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ වාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ පරනගම ගම්මුලාදැනි වසමේ හපුකොටුවේ ගමමැද්ද ගමෙහි පිහිටි ගල්කොටුවේ වත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් 50′ × 5′ක් පමණවූ පහත සඳහන් මායිම් ඇති ඉඩම් කොටස :—

උතුරට: එම ඉඩමේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : මැටිගන්නාවෙල ඇල ;
දකුණට : ආර්. බී. එච්. හපුකොටුව විසින් අයිතිවාසිකම කියනු ලබන බඩතැල්දෙනියේ ඇල සහ මරක්කයා කුඹුර ;
බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

අංක : ජේ 57/58 ඒඇෆ් 584/ඇල්.ඩී/ඇෆ්. 31 (ඇල්.ඩී/සී/9).

1958ක්වූ ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනත අනුව 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනත අනුව, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ වාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මාතර දිස්ත්‍රික්කයේ ගඟබඩපත්තුව ආදායම් නිලධාරි කොටසේ ඕවිටිගමුව ගම්මුලාදැනි කොටසේ ඕවිටිගමුව බටහිර ගමේ පිහිටි මැටිහක්කල දෙණිය නොහොත් දෙල්ගහ හේන (අංක 572 දරණ අවසාන ගම් සිතියමේ අංක 167 දරණ බිම් කැබැල්ල) නමැති ඉඩමෙන්, ප්‍රමාණයෙන් අක්කර 1½ පමණ විශාල කොටසක්. මායිම් :—

උතුරට : මැටිහක්කවත්තෙහේන නමැති ඉඩම සහ එම්ආර්/ඕවිටිගමුව ගැහැණු පාසල් වත්ත (රජයේ ඉඩම) ;
නැගෙනහිරට : මැටිහක්කවලවත්ත දෙණිය නමැති ඉඩම සහ එම්ආර්/ඕවිටිගමුව ගැහැණු පාසල් වත්ත (රජයේ ඉඩම) ;
දකුණට : මැටිහක්කවලවත්ත ආරච්චිගේ දෙණිය නමැති ඉඩම ;
බටහිරට : මැටිහක්කවල ඉහ්න නමැති ඉඩම.

අංකය: ජේ.57/58 ඊ 321/එල්බී.2357.

1958ක්වූ ඔක්තෝබර් මස 1 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

යොමු අංකය : ඇල් ඒ. 3661.

**1954 අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනය කරනු ලැබූ**
**1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත්, එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරනු ලැබූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා මම මෙයින් ප්‍රකාශ කරමි :

පහත සඳහන් මායිම් තුළ පිහිටා ඇති, පුත්තලම් දිස්ත්‍රික්කයේ පුත්තලම් පත්තු සහ කඩවත්හි, කට්ටෙයිකාඩු ගම්මුලාදැනි තැනගේ කොට්ඨාශයේ කන්දලෙහි පිහිටි අක්කර 16ක් පමණ වපසරියකින් යුත් මන්වාඩි කානි නමැති ඉඩම් කොටසක් :—

උතුරට : පාර ;
නැගෙනහිරට : මානියගරන් වාවුන් ගම් සහා පාර ;
දකුණට : ඇම්. පේදුරු ප්‍රනාන්දු විසින් හිමිකම් පාන ඉඩම ;
බස්නාහිරට : ඇස්. අබ්දුල් කාසිම් විසින් හිමිකම් පාන ඉඩම.

යොමු අංකය : ජේ 57/58 ඇල් 400 (වීර්).

1958ක්වූ ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමති.

---

යොමු අංකය : ඇල් ඒ. 3662.

**1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරනු ලැබූ**
**1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත්, එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරනු ලැබූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

පහත් සඳහන් මායිම් තුළ පිහිටා ඇති, පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම් පත්තු සහ කඩවත්හි, කඩයාමොට්ටෙයි ගම්මුලාදැනි තැනගේ කොට්ඨාශයේ කනමූලෙයි ගමේ පිහිටි අක්කර 44, රූ. 1, පර්චස් 0ක වපසරියකින් යුත් වට්ටනාර් පිරිවු නමැති ඉඩම් කොටසක් :—

උතුරට : කරත්ත පාර, සූරිවායල්හි කේ. ඇම්. මොහම්මදු සෙරීෆ්පු, සී. නාගූර් පිච්චෙයි සහ පී. කේ. නයිනා මොහමදු යන අය විසින් හිමිකම් පාන පේමඩු තෝට්ටම් නමැති ඉඩම ;
නැගෙනහිරට : මානියාගරන් වාවුන් (ගම සහා පාර) ;
දකුණට : ඒ. ඇම්. අලි මරික්කාර් විසින් හිමිකම් පාන වට්ටනාර් පිරිවු නමැති ඉඩම ;
බස්නාහිරට : ඊ. ඇස්. ඇම්. මොහමඩ් කාසිම් මරික්කාර් විසින් හිමිකම් පාන කච්චන්වොලෙයි නමැති ඉඩම.

යොමු අංකය : ජේ 57/58 ඇල් 402 (වීර්).

1958ක්වූ ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමති.

---

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරනු ලැබූ**
**1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥපනතින් සංශෝධනය කරනු ලැබූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

පහත සඳහන් මායිම් තුළ පිහිටා ඇති, හලාවත දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරළේ බොරලැස්සේ ගම්මුලාදැනි තැනගේ කොට්ඨාශයට අයත් බොරලැස්සේ පිහිටි පීරිස් වත්ත නැමති ඉඩමෙන් අක්කර 30ක පමණ වපසරියකින් යුත් කොටසක් :—

උතුරට : එම ඉඩමේ ඉතුරු කොටස ;
නැගෙනහිරට : බොරලැස්සේ සිට කොනාවිල දක්වා ඇති ගම් සහා පාර ;
දකුණට : ඉසබෙල් පෙරේරා, මාතා පීරිස්, මේරි විජේසේකර මහත්මිය, ඩබ්ලිව්. සෙබස්තියන් ප්‍රනාන්දු, මාසලීන් ප්‍රනාන්දු සහ වෙනත් අය විසින් හිමිකම් පාන මිල්ලගහවත්ත නැමති ඉඩම ;
බස්නාහිරට : ඇම්. සෙබස්තියන්, ඇම්. ලෙනාඩ්, ඇම්. ඒ. හිරිගෝරිස්, ඩබ්ලිව්. මරියා ප්‍රනාන්දු, ඩබ්ලිව්. ක්ලේරා, ඩබ්ලිව්. මේරි ප්‍රනාන්දු, සිසිලියා ප්‍රනාන්දු සහ වෙනත් අය විසින් හිමිකම් පාන අඹගහවත්ත නැමති ඉඩම සහ කොළඹ සිට බන්ගදෙනිය දක්වා ඇති දුම්රිය මාර්ගය.

යොමු අංකය : ජේ.57/58 ඇල්. 425(වීර්).

1958 ඔක්තෝබර් මස 9 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමති.

---

ඇල්.ඒ.3671.

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරනු ලැබූ**
**1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරනු ලැබූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

පහත සඳහන් මායිම් තුළ පිහිටා ඇති, හලාවත දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ, අංක 537 දරණ මරක්කලගම ගම්මුලාදෑනි තැනගේ කොට්ඨාශයට අයත් මහබද්දේගම පිහිටි අක්කර 1, රූඩ් 2, පර්චස් 0 ක් විශාල හෙට්ටිපල්ලියවත්ත නමැති ඉඩම් කොටසක්.

උතුරට : එච්. ඩී. ජුලිහාමිට අයිති ඉඩම ;
නැගෙනහිරට : හින්දු කෝවිල භාරකරු විසින් හිමිකම් පාන ඉඩම ;
දකුණට : මහබද්දේගම පාර ;
බස්නාහිරට : කඩ වීදිය.

යොමු අංකය : ජේ.57/58 ඇස්. 677.

1958ක්වූ ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමති.

---

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥපනතෙන් සංශෝධනවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළේ එරමිනිගම්මන වසමේ ගිනිහප්පිටිය ගමේ පිහිටා තිබෙන ගඩුමන්ගේ වත්ත නමැති ඉඩමෙන් අ. 1, රූ. 2, ප. 0ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටස. ඊට මායිම් :—

උතුරට : ඒ. චාර්ල්ස් අයිතිකම් කියන උනපොතගොඩවත්ත ;
නැගෙනහිරට : ආර්. ඩී. රන්කිරා අයිතිකම් කියන උනපොලගොඩ වත්ත සහ කෑග/ගිනිහප්පිටිය රජයේ ගැහැණු පාසැලේ වත්ත ;
දකුණට : එස්. එම්. සිද්දිකු ලෙබ්බේ අයිතිකම් කියන ගුඩුමන්ගේවත්ත ;
බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

අංකය : ජේ.57/58 ඊ. 478/එල්.එම්. 5735.

1958 ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය : කිච්. ඒ. 387.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැවි 1954රේ අංක 39 දරණ ඉඩම් ලබා හැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මුලික සිතියමේ නො. ඒ 4,236. ගම : ගොඩ ගෙදර

| කැබැල්ල | ඉඩමේ නම | විස්තර | අයිතිකම් කියන අය | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1. | කෝන්ගහ වත්ත නොහොත් බුළුගහ වත්ත | තාවකාලික ගෙයක් ඇති පොල් ඉඩම ... | ජී. පී. පීරිස්, හිටපු ගම්මුලාදෑනි තැන, පැලියගොඩ | 6 2 03·3 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958ක්වූ දෙසැම්බර් මස 23 වැනි දින පෙරවරු 10 ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958ක්වූ දෙසැම්බර් මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ආර්. ද සිල්වා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ වැඩ බලන අතිරේක
උප ඒජන්තතුමා.

වර්ෂ 1958ක්වූ ඔක්තෝබර් මස 30 දින,
කොළඹ කච්චේරියේදීය.

---

අංකය. ඇල්ඩී.5036.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කට්යුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනය කරන ලද, 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ මැදසියපත්තුවේ බනන්ගේ ගමෙහි පිහිටි ප්‍රමාණයෙන් අක්කර 37, රූඩ් 1, පර්චස් 17ක් වූ මුලික සිතියම් අංක ඒ 2,547 හි කැබලි අංක 1 සහ 2 යනුවෙන් මැන විස්තර කරන ලද ගල්ලෙන වත්ත නමැති ඉඩම.

කැබලි අංක 1 ට අයිතිවාසිකම් කියා සිටින්නේ, බම්බලපිටියේ අංක 23 දරණ මිලගිරි නිවසෙහි පදිංචි ඊ. ඒ. මැන්දිස් මහත්මයාය. කැබලි අංක 2ට අයිතිවාසිකම් කියන්නේ බම්බලපිටියේ අංක 23 දරණ මිලගිරි නිවසෙහි පදිංචි කෝරළේගෙදර බියෝමැණිකාය.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 දෙසැම්බර් මස 9 වන දින පෙරවරු 10 ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958 දෙසැම්බර් මස 2 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

තවද ඒ ඉඩම සම්බන්ධව ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරුකර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

වර්ෂ 1958ක්වූ ඔක්තෝබර් මස 28 දින,
මහනුවර කච්චේරියේදීය.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

---

අංකය : ඇල් ඒ/බී 85.

## 1954 අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධිතවූ 1950 අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

පොදු කටයුත්ත : රත්ගම ගම් කාර්‍ය්‍ය සභාවේ නිවාස යෝජනා ක්‍රමය.

ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ගරු ඇමති තුමා විසින් ඔහුගේ 57.1.9 වැනි දින අංක ජේ 56 ඇල්ජී 340 දරණ ප්‍රකාශනයෙන් තීරණය කර 57.2.22 වැනි දින අංක 11,074 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පරිදි,

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය : වැල්ලබඩ පත්තුව
ගම්මුලාදැනි වසම : ගම්මැද්දෙගොඩ
ගම : ගම්මැද්දෙගොඩ

සැලැස්මේ අංකය : ඒ 1,683 දරණ මූලික සැලැස්ම

| කැබිලි අංකය | ඉඩමේ නම | විස්තරය | ප්‍රමාණය, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 1. | දෙනයිදෙගෙවත්ත ... ... | පොල් වත්ත ... ... ... | 2 | 0 | 19·2 |
| 2. | පෙට්ටිවත්ත ... ... ... | එම ... ... ... | 0 | 2 | 25·9 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 දෙසැම්බර් 10 වැනි දින පූ. භා. 10ට ගාල්ලේ කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958 දෙසැම්බර් 2 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

අයිතිවාසිකම් තිර කිරීමට අදාල වන සියලුම ඔප්පු සහ ලියකියවිලි ආදිය විභාගය පවත්වන වේලාවේදී ඉදිරිපත් කළ යුතුයි.

අංක ඒ 1,683 දරණ මූලික සැලැස්මේ පිටපතක් බැලීම සඳහා ගම්මැද්දෙගොඩ ගම්මුලාදැනි තැනගේ කාර්‍ය්‍යාලයෙහි තැන්පත් කර ඇත.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
ගාලු දිස්ත්‍රික්කයේ ඉඩම් රජයට ගැනීමේ නිලධාරි.

1958 ඔක්තෝබර් මස 31 වැනි දින,
ගාල්ලේ කච්චේරිය.

---

අංකය : ඇල්ඇල්ඒ 6091.

## 1954 අංක 39 දරණ සංශොධිත ඉඩම් ආඥපනත අනුව සංශොධනය කළ පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැවි, 1954රේ අංක 39 දරණ සංශෝධිත ඉඩම් ආඥපනත් අනුව සංශෝධනය කළ පරිදි, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත මැද කෝරලේ බලංගොඩ වසමේ අංක 298 දරණ අවසාන ගම් සිතියමේ 3 වෙනි අතිරේකයේ කිරිදිගල ගමේ පිහිටි මැන අවසාන කරන ලද මෙහි පහතින් දක්වා ඇති ඉඩමය.

| ලොට් | නම | විස්තර | අයිතිවාසිකම් කියන්නෝ | ප්‍රමාණය, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 196. | පුවක්ගහකුඹුර සහ පුවක්ගහඅරව ... | කුඹුර ... | ආර්. රගුන්නාර් මහතා සහ එස්. රගුන්නාර් මහත්මිය, නො.41 මාවත, වැල්ලවත්ත සහ සරස්වතී සිවසුප්‍රමනියම් නො. 10 කුපර් පාර, සිංගප්පූරුව. දේපලබාරකරු : ඩබ්ලිව්. ඇස්. නඩරාජා, වෙට්නෝල් පාර, බලංගොඩ | 0 | 0 | 06·4 |
| 197. | එම ... ... | එම ... | එම ... ... ... | 0 | 0 | 06·6 |

ඉහත සඳහන් ඉඩම්වලට වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958.12.6 දින උදේ 10 ට වේලාවට රත්නපුර කච්චේරියේ දී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958.11.28 දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ආර්. වීරකෝන්,
ඉඩම් ලබාගැනීමේ නිලධාරි තැන.
රත්නපුර දිස්ත්‍රික්කය.

වර්ෂ 1958ක්වූ නොවැම්බර් මස 12 දින,
රත්නපුර කච්චේරියේදීය.

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## දීමනා පත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි

මෙහි පහත විස්තර දක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනා පත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස මාතර දිසාපති කාර්යාලයේදී 1958 නොවැම්බර් මස 24 වෙනි දින පූ. භා. 10.30 ට 1935හේ අංක 19 දරණ ඉඩම් සග්‍රික කරීමේ ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් විභාග කළ යුතුයි.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මෙන්ඩිස්,
ඉඩම් කොමසාරිස් තැන වෙනුවට.

**දීමට යන ඉඩමේ විස්තර**

| ප්ලෑනේ අංකය හා ගම | කැබෙල්ලේ අංකය | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම | ප්‍රමාණය, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| අ.ග.සි. 18 බෙංගමුව ... ... | 393 | ... ප්‍රේමරත්න ඉලේසිංහ ... ... ... | 5 | 0 | 05 |
| අ.ග.සි. 26 බානගල ... ... | 180 | ... හේවා ගජමන්ගෙයි සයිමන් ... ... | 9 | 1 | 31 |
| අ.ග.සි. 44 රොටුඹ ... ... | 346 | ... කරන්දූගොඩ කන්කානම්ගෙයි ලීලසේන අමරසේකර ... | 9 | 1 | 34 |
| මූ.සි. A163 කරගොඩ-උයන්ගොඩ ... | 15 | ... වල්ගම කන්කානම්ගෙයි මාටින් සමරවීර ... | 6 | 0 | 22 |

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරනු ලබන්නේ **ප්‍රසිඩ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඩ කරණු නොලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා **1955 ජනවාරි 1 වැනි** දින සිට අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුවම අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරණ දින තුනකට ප්‍රථම **පස්වරු 4ට** සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් **කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍ය්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... ... | එක් කාණ්ඩයක් සඳහා... | 15 | 0 |
| | Iවෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... ... | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේනම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ, රජයේ ප්‍රකාශන කාර්‍ය්‍යාංශයේ අධිකාරි තැනගෙන්** ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී